# කාර්යාල ප්‍රවාහන සේවාවන්

# ලියාපදිංචි කිරීම

1991 අංක 37 දරණජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව බස් රථ මගින් මහජනතාවගේ මගී ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ කර්තව්‍යක් වේ .

රටෙහි පවතින කොවිඩ්-19 වසංගත තත්වය මත සුරක්ෂිත ප්‍රවාහන සේවාවක් තහවුරු කිරීම සඳහා බස් රථ මගින් දෛනිකව ප්‍රවාහන කටයුතු සිදු කිරීම සම්බන්ධ දත්ත රැස් කිරීමේ අරමුණින් අන්තර් පළාත් සහ පළාත් තුල ධාවනයෙහි නිරත සියලුම කාර්යාල ප්‍රවාහනසේවා බස් රථ ලියාපදිංචි කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ .

ඒ අනුව **ඔබ,** කාර්යාල ප්‍රවාහන සේවයේ නියුතු බස් රථයක හිමිකරුවකු වන්නේ නම් පහත සඳහන් ආකෘතිය මගින් ඉල්ලා ඇති තොරතුරු ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත 2021/12/20 වන දිනට පෙර ලබා දෙන්න.

එසේම **ඔබ ආයතනය,** කාර්යාල ප්‍රවාහන සේවා බස් රථ දෛනික ප්‍රවාහන කටයුතු සඳහා යොදවා ගන්නේ නම් පහත සඳහන් ආකෘතිය මගින් ඉල්ලා ඇති තොරතුරු ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත2021/12/20 වන දිනට පෙර ලබා දෙන්න.

| බස් රථ අංකය | බස් රථ හිමිකරුගේ -<br>1. නම<br>2. ලිපිනය<br>3. දුරකථන අංකය | ගමනාරම්භය සහ ගමනාන්තය |
|---|---|---|
| | | |

මේ සම්බන්ධ වැඩි විස්තර 011-2587372යන අංකය මගින් සහකාර අධ්‍යක්ෂ (ධාවන හා සේවා අධීක්ෂණ) අමතා ලබා ගත හැක.

**සභාපති ,**
**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**
**අංක 241 ,**
**උද්‍යාන පාර , කොළඹ 05**
**Fax – 011-2503725**
**Email- chairman@ntc.gov.lk**